

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)

දහසයවන වාර්ෂික වාර්තාව

2020

දැක්ම

" මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ක්ෂේත්‍ර තුළ
දැනුම, සම්පත්, පර්යේෂණ, අධ්‍යාපනය සහ සමාජ
ක්‍රියාකාරකම් අතර සහක්‍රියා ගොඩනගමින්,
විශිෂ්ඨත්වය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර කීර්තිය ලත්
මධ්‍යස්ථානයක් බවට පත් වීම."

මෙහෙවර

''සියලු ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලවල ඉගැන්වීම් සහ
පර්යේෂණ ශක්තිමත් කිරීමට සහ වැඩි දියුණු කිරීමට
ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, පර්යේෂණ හා
ප්‍රතිපත්ති දායකත්වය හරහා රටෙහි සහ සමාජයෙහි
සංවර්ධනයට විශ්වවිද්‍යාල දායක විය යුතු බව
අවබෝධ කර ගනිමින්, NCAS සෛද්ධාන්තික සහ
ව්‍යවහාරික දෙයාකාරයෙන්ම මානව ශාස්ත්‍ර හා සමාජ
විද්‍යා ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධිමය, පශ්චාත්
ආචාර්ය උපාධිමය සහ වෙනත් පර්යේෂණවලට
සහාය දැක්විය යුතු අතර එම දිශාව දෙසට විද්වතුන්
අභිප්‍රේරණය කරමින් සහ ප්‍රතිලාභ ලබා දෙමින් උසස්
චින්තනය සහ නිර්මානාත්මක නිර්මාණශීලිත්වය
ප්‍රවර්ධනය කළ යුතුය. NCAS එහි පරමාර්ථය
සාක්ෂාත් කර ගැනීමට ජාතික හා ජාත්‍යන්තර
සංවිධාන සමඟ ජාල ගත වෙමින් ශ්‍රී ලංකාවේ
විශ්වවිද්‍යාල තුළ අග්‍ර මණ්ඩලයක් වනු ඇත.''

පෙරවදන



1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ වගන්තිය ප්‍රකාරව 2005 අංක 2 දරන ආඥා පනත යටතේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) පිහිටුවන ලද අතර එය මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්ට අදාළ පර්යේෂණ හා බුද්ධිමය ක්‍රියාකාරකම් සඳහා වන නිවහන එය විද්වතුන් අතර පරිකල්පනීය චින්තනය, නවෝත්පාදනය, නිර්මාණශීලීත්වය හා මුල් සොයා ගැනීම් ප්‍රවර්ධනය කරයි.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛතම ප්‍රදාන පිරිනැමුම් ආයතනය ලෙස මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මේ වන විට දේශීය හා විදේශීය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා විද්වතුන් 501 දෙනෙකුට මූල්‍ය ආධාර ලබා දී ඇත. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මඟින් විද්වතුන්ට ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැලසීමට, පර්යේෂණ ක්‍රමවේදයන්, සංඛ්‍යානමය විශ්ලේෂණයන් සහ අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව අඛණ්ඩ පුහුණුව ලබා දෙයි. NCAS 2013 වර්ෂයේ සිට, පරිපාලන කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලට පුහුණුව ලබා දීම සඳහා සිදු කරන ක්‍රියාකාරකම් පුළුල් කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලවල අධ්‍යයන හැකියාවන්, පරිපාලන හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වැඩමුළු කිහිපයක් පවත්වනු ලැබීය. පර්යේෂණ ක්‍රමවේද, සංඛ්‍යාන විශ්ලේෂණ පාඨමාලා (SPSS, AMOS, Eviews ආදිය), ව්‍යාපාර හා පරිපාලනමය රචනය සහ පරිගණක මෘදුකාංග පාඨමාලා (මයික්‍රොසොෆ්ට් එක්සෙල් ආදිය) 2020 වර්ෂයේ දී පවත්වන ලද ප්‍රධාන පාඨමාලා වේ

විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර බොහෝ අධ්‍යයන කාර්ය මණ්ඩල සහ පර්යේෂණ, පරිපාලන කාර්ය මණ්ඩල සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල එයින් ප්‍රතිලාභ ලැබීය. මෙම පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වනුයේ කලා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨවල පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා විද්‍යාත්මක මූලධර්ම මත පදනම්ව ඔවුන්ගේ පර්යේෂණ කුසලතා වර්ධනය කර ගැනීමට පුහුණුව සැපයීමයි. සහභාගීවන්නන්ගේ න්‍යායාත්මක හා ආනුභූතික පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් විද්වත් මණ්ඩලයක් විසින් මෙම පුළුල් පාඨමාලා පවත්වනු ලබයි. දේශන සිදු කිරීමේ දී ආචාර්යවරුන් විද්‍යුත් ඉගෙනුම් සම්පත් සහ මෘදුකාංග යෙදුම් යොදා ගනු ලබයි. පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා සංඛ්‍යානමය පුහුණුව ලබා දීම සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙ හි ස්ථාපිත පරිගණක විද්‍යාගාරය භාවිතා කරන ලදී. NCAS විසින් එහි වෙබ් අඩවිය හරහා පර්යේෂකයන්ට විද්‍යුත් පුස්තකාල සම්පත් පහසුකම් ද සපයනු ලබයි. NCAS විසින් 2020 දී සාර්ථකව ක්‍රියාත්මක කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ 2021 ජනවාරි 22-23 දිනවල Zoom තාක්ෂනය හරහා NCAS රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පිළිබඳ 3 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයයි. සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිතයා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා සහභාගි වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ හිටපු පීඨාධිපති සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා විසින් සමාරම්භක සැසියේ ප්‍රධාන දේශනය පවත්වන ලදී. පර්යේෂණ පත්‍රිකා කැඳවමින් පළකළ දැන්වීමට ප්‍රතිචාර වශයෙන් NCAS වෙත පර්යේෂණ සාරාංශ 302ක් ලැබුණි. එම පර්යේෂණ සාරාංශ අතරින් පර්යේෂණ සාරාංශ 180ක් මෙම සම්මන්ත්‍රණයට තෝරා ගන්නා ලදි. කෙසේ වෙතත්, මෙම පරිසංවාදය සඳහා සම-කතුවරුන් ඇතුළුව කතුවරුන් 170 දෙනෙක් ලියාපදිංචි වුහ. තෝරා ගත් සංඛ්‍යාවෙන්, පර්යේෂණ පත්‍රිකා 99ක් අදාළ කතුවරුන් විසින් සමාන්තර කාණ්ඩ 3ක් තුළ ඉදිරිපත් කරන ලදි.

මෙම ආයතනික සැලැස්මේ දක්වා ඇති පරිදි මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයනවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) අඛණ්ඩව සංවර්ධනය කිරීමට අප කටයුතු කරන්නෙමු.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ
වැඩ බලන අධ්‍යක්ෂ

පටුන

ආයතනික තොරතුරු	7
හැඳින්වීම	8
කළමනාකරණය	9-17
NCAS හි කාර්ය මණ්ඩලය	18-20
වැඩමුළු/පාඨමාල/ ඉදිරිපත් කිරීම්	21-24
තොරතුරු තාක්ෂණ සම්පත්	25
ශිෂ්‍යත්ව වැඩසටහන්	26-37
පුස්තකාල/විද්‍යුත් සම්පත්	38
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව	38-39
තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව	40
මූල්‍ය වාර්තාව	41-59
විගණකාධිපති වාර්තාව	60-66
විගණන විමසුමට පිළිතුරු	67

වගු සහ තොරතුරු ප්‍රස්තාර

වගු

01. කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය (COM)	8-13
02. NCAS හි සේවක සංඛ්‍යා තනතුරු	18
03. 2019 දී පවත්වන ලද වැඩමුළු/පාඨමාලා/ඉදිරිපත් කිරීම් වල සාරාංශය	20
04. විෂය කාණ්ඩය අනුව ප්‍රදානලාභීන්ගේ ප්‍රභේදනය 2005-2019	25
05. ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව සඳහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා කිරීම	27
06. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලවල සේවය කරන NCAS ආචාර්ය උපාධි ශිෂ්‍යත්වලාභීන්ගේ ව්‍යාප්තිය	29
07. සම්පූර්ණ කරන ලද ප්‍රදාන	31-33
08. 2020 වර්ෂය තුළ ලබා දෙන ලද ප්‍රදාන	33-34
09. ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණවේද විශ්වවිද්‍යාලය (ඕස්ට්‍රේලියාව) - පී.එච්.ඩී. ශිෂ්‍යත්ව වැඩසටහන	34-36

තොරතුරු ප්‍රස්තාර

01. NCAS හි සංවිධාන ව්‍යුහය	19
02. විෂයන් අනුව ප්‍රදානලාභීන්ගේ ප්‍රභේදනය 2005-2019	26
03. ප්‍රදානය කරන ලද අරමුදල් (2008- 2019)	28
04. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සේවය කරන NCAS ආචාර්ය උපාධි ශිෂ්‍යත්වලාභීන්ගේ ව්‍යාප්තිය (NCAS විසින් ලබා දෙනු ලැබූ ප්‍රදාන 2005-2019)	30

ආයතනික තොරතුරු

ආයතනයේ නම	:	මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS)
ලියාපදිංචි කාර්යාලය	:	අංක 6A, සුකස්තාන් ගාඩන්ස්, වෝඩ් පෙදෙස, කොළඹ 07.
සංයුතිය සහ නීතිමය ආකෘතිය	:	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ 2005 අගෝස්තු ආඥා පනත යටතේ නෛතිකව පිහිටුවන ලද රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.
අරමුදල් ප්‍රභවය	:	මහා භාණ්ඩාගාර අරමුදල්
මූල්‍ය කාලපරිච්ඡේදය	:	2020 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දක්වා
අධ්‍යක්ෂ	:	මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ
විගණක	:	විගණකාධිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව අභ්‍යන්තර විගණක, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
බැංකුකරු	:	ලංකා බැංකුව, ටොරින්ටන් ශාඛාව
ඇමතුම් තොරතුරු	:	දුරකථන : 011-2685850, 011-2693974 ෆැක්ස් : 011-2693975 විද්‍යුත් ලිපිනය : info@ncas.ac.lk වෙබ් අඩවිය : www.ncas.ac.lk

හැඳින්වීම

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (NCAS) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේවූ 2005 අංක 2 දරන ආඥා පනත යටතේ නෛතිකව පිහිටුවන ලද අතර 2005 ඔක්තෝබර් 19 දිනැති අංක 1415/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව 2008 සැප්තැම්බර් මස 15 දිනැති අංක 1567 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ 2008 අංක 03 දරන මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (සංශෝධනය කිරීමේ) ආඥා පනත මඟින් සංශෝධනය කරන ලදී.

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය මූලිකවම පිහිටුවනු ලැබුවේ ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවල සේවය කරන අධ්‍යයන ප්‍රජාවේ අවශ්‍යතාවන් ඉටු කිරීම පිණිසය. මහාචාර්ය සේනක බණ්ඩාරනායක මහතා සහ අදාළ ක්ෂේත්‍රවල ජ්‍යෂ්ඨ මහාචාර්යවරු කීපදෙනෙක් විසින් එය ආරම්භ කරන ලදී. කඩිනමින් ව්‍යාප්ත වන ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර අංශවල අධ්‍යයන අවශ්‍යතාවන් ඉටු කිරීම පිණිස දැනට ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලවලින් බැහැර ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව මතුවිය. සුදුසුකම් අත්කර ගන්නා සහ විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂා කරන ශිෂ්‍යයින්ගේ සංඛ්‍යාවේ වර්ධනයට ප්‍රතිචාර වශයෙන් ප්‍රතිපත්ති වෙනස් කිරීම සමඟ 1970 දශකයේ අග භාගයේ සිට දිවයිනේ පළාත් කීපයකම නව විශ්වවිද්‍යාල රාශියක් විවෘත කරන ලදී. මෙම නව ආයතනවල පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය කළ කාර්ය මණ්ඩල අවශ්‍යතාවන් සපුරාලූයේ පිහිටුවා තිබූ විශ්වවිද්‍යාල හරහාය. අධ්‍යයන ප්‍රජාව හිඟවීම සහ සාර්ථක විශ්වවිද්‍යාලවල පවා ශික්ෂණය දුර්වලවීම මෙහි අවසාන ප්‍රතිඵලය විය. අලුතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාලවලට අත්දැකීම් බහුල හා සුදුසුකම්ලත් කථිකාචාර්යවරු අඩු වන අතර පර්යේෂණ හා උසස් අධ්‍යාපන කටයුතු කිරීම සඳහා වූ පහසුකම් ද අවම වේ. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා යන ක්ෂේත්‍රවල බඳවාගත් නවක නිලධාරීන්ට පශ්චාත්-උපාධි අධ්‍යයන සිදු කිරීමට දිරිගැන්වීම හරහා පුහුණු කිරීම නව විශ්වවිද්‍යාල පිහිටුවීම සමඟ ඇති වූ රික්තය පිරවීම පිණිස ගත් පියවරකි. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය තරුණ ගුරුවරුන්ට පර්යේෂණ ක්‍රමවේද, යෝජනා ගොඩනැගීම, පර්යේෂණ සඳහා අවශ්‍ය කරන සංඛ්‍යාලේඛන හා අධ්‍යයන රචනා සඳහා අවශ්‍ය කරන ලේඛන නිපුණතා ආදිය පිළිබඳව දැනුවත් කිරීම හරහා ඔවුන් පශ්චාත්-උපාධි අධ්‍යයන කටයුතුවලට සූදානම් කිරීම සඳහා උපකාරී විය.

මානව සම්පත් සංවර්ධනය සහ උසස් පර්යේෂණාත්මක අධ්‍යයන කටයුතු සඳහා 2020 වසර අවසාන වන විට ශාස්ත්‍රඥයින් 501 දෙනෙක් සඳහා ඔවුන්ගේ දේශීය හා විදේශීය අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය අරමුදල් මඟින් මූල්‍යාධාර ලබා දෙන ලදි. මේ වන විට මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල පද්ධතියේ විශාලතම මානව සම්පත් සංවර්ධන වැඩසටහන බවට පත්ව ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති සහ කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ මහත්මිය 2020 මැයි මස 04 වන දින වැඩබලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී. මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය, ඇයගේ නායකත්වය යටතේ මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ඔවුන්ගේ පර්යේෂණ හැකියාව ඉහ නැංවීම අරමුණු කර ගනිමින් පුහුණු වැඩසටහන් බොහෝමයක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් හඳුන්වාදීමේ ප්‍රධානතම අරමුණ වූයේ Nvivo / AMOS / Eviews වැනි නවීන මෘදුකාංග භාවිතා කරමින් සමාජ විද්‍යා පර්යේෂණවල ගුණාත්මක පර්යේෂණ පැනිකඩ සංවර්ධනය කිරීමයි.

තවද, NCAS විසින් මීට පෙර ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන්/ පර්යේෂණ යෝජනා සංවර්ධනය පිළිබඳ වැඩමුළු, සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේදයන් සහ SPSS භාවිතා කරමින් සංඛ්‍යාන විශ්ලේෂණ තව දුරටත් අඛණ්ඩව පවත්වන ලදි. එම අවස්ථාවන් පිළිබඳ විස්තරයන් වෙන් වෙන් වශයෙන් දැක්වේ. උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් වීම්,පර්යේෂණ සංවර්ධන සහ උසස් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය තුළ දී සිදු කරන ලද ක්‍රියාකාරකම්වල යහපත් ප්‍රතිලාභ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්ට පමණක් සීමා නොවූ අතර අනෙකුත් අදාළ ක්ෂේත්‍රයන්ට ද ඉන් ප්‍රතිලාභ සැලසුණි.

සමාලෝචිත වර්ෂය තුළ, NCAS ප්‍රදානලාභීන්ට ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් ඉදිරිපත් කිරීමටත්, ප්‍රකාශයට පත් කිරීමටත් අවස්ථාවක් උදාකර දීමේ අරමුණින්, 2021වර්ෂයේ ජනවාරි මස 22-23 දිනයන්හි දී තුන්වන අන්තර්ජාතික පර්යේෂණ පරිසංවාදය NCAS විසින් zoom තාක්ෂණය ඔස්සේ NCAS රැස්වීම් ශාලාවේදී සාර්ථකව පවත්වන ලදි.

කළමනාකරණය

ව්‍යුහයන්/ රැස්වීම්

2008 සැප්තැම්බර් මස 15 දිනැති අංක 1567 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කළ 2008 අංක 03 දරන මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය (සංශෝධනය කිරීමේ) ආඥා පනත අනුව පාලක සභාව සහ කළමනාකරණ සභාව පහත දැක්වෙන පරිදි සංයුක්ත වේ :-

පාලක සභාව සහ කළමනාකරණ සභාව

මධ්‍යස්ථානයේ ප්‍රධාන ප්‍රතිපත්ති සම්පාදක හා පාලන අධිකාරිය වන පාලක කවුන්සලය වසරකට අවම වශයෙන් දෙවරක් රැස් වේ.

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙ හි පරිපාලන හා අධ්‍යයන අධිකාරිය වන කළමනාකරණ සභාව, වසරකට අවම වශයෙන් සය වරක් රැස් වේ

වගුව 01: කළමනාකරණ මණ්ඩලයේ (COM) සංයුතිය පහත දක්වා ඇත: -

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි අධ්‍යක්ෂ / NCAS සභාපති/ COM (2018 ජූනි 01 සිට, වැඩ බලන අධ්‍යක්ෂ) (2019 මැයි 02 සිට ස්ථිර)	මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි කැලණිය විශ්වවිද්‍යාලයේ (UoK) භූගෝල විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙක් වන අතර ඔහු ජාතික හා ජාත්‍යන්තර තලයේ ප්‍රමුඛ තනතුරු හෙබවීය. මේ වන විට මහාචාර්ය ධර්මසිරි මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක ලෙසත්, නෙදර්ලන්තයේ හේග් හි ස්ථිර බෙරුම්කරණ අධිකරණයේ (PCA) විශේෂිත මණ්ඩල සාමාජිකයන් පිළිබඳ බෙරුම්කරුවන්ගේ සහ විද්‍යාත්මක විශේෂඥයන්ගේ සාමාජිකයෙක් ලෙසත් කටයතු කරයි. ඔහු පරිසර අමාත්‍යාංශය යටතේ පවතින මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) සභාපතිවරයෙක් ලෙසද සේවය කර ඇත. මහාචාර්ය ධර්මසිරි, කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ ප්‍රධානී, පශ්චාත් උපාධි වැඩසටහන් සම්බන්ධීකාරක, IRQUE හා HETC වැඩසටහන් සම්බන්ධීකාරක ලෙස සේවය කළේය. මහාචාර්ය ධර්මසිරි 1985 දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් භූගෝල විද්‍යාව පිළිබඳ (විශේෂ) උපාධියක් ලබා ඇත. පසුව සංස්කෘතික සම්බන්ධතා සඳහා වන ඉන්දියානු කවුන්සිලය (ICCR) මඟින් ඔහුට ලබා දෙන ශිෂ්‍යත්වයක් යටතේ 1992 දී ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් හි එස්කේ විශ්වවිද්‍යාලයේ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කරන ලදී. 1997 දී නෝර්වේ කෘෂිකාර්මික විශ්ව විද්‍යාලයේ (AUN) ස්වාභාවික සම්පත් කළමනාකරණය සහ තිරසාර කෘෂිකර්මාන්තය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හැදෑරීම වෙනුවෙන් ඔහුට නෝරාඩ් ශිෂ්‍යත්වය පිරිනමන ලදී. එහි සාමාජිකත්වය තවදුරටත් දීර්ඝ කළ අතර ඔහු 1999 දී නෝර්වේ කෘෂිකාර්මික විශ්වවිද්‍යාලයේ එම ක්ෂේත්‍රයේම විද්‍යාපති උපාධිය සම්පූර්ණ කරන ලදී. මහාචාර්ය ධර්මසිරි ඉන්දියාවේ පූනේ විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා අධ්‍යයනාංශයෙන් ඔහුගේ ආචාර්ය උපාධිය සම්පූර්ණ කළේය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ වැඩ බලන අධ්‍යක්ෂ/NCAS සභාපති/COM (2020 මැයි 04 දින සිට)	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපතිනිය වන අතර මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානයේ වැඩබලන අධ්‍යක්ෂවරිය තවද, ඇය කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ, රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරියකි. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ B.Sc උපාධිය හා FRSC, F.I .Chem.C, C.Sci, C.C.රසායන විද්‍යා ආචාරය උපාධිය (Cardiff,Uk) ලබා ගන ඇත. ඇය කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ සහ ශ්‍රී යවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ සහකාර කථිකාචාර්යවරියක් ලෙසත්, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරියක් ලෙසත්, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් ලෙසත්, ජපානයේ ජපාන පරමාණුක බලශක්ති පර්යේෂණ ආයතනයේ ටෝකායි පර්යේෂණ ආයතනයේ පරිසර විද්‍යා දෙපාර්තමේන්තුවේ පශ්චාත් - ආචාර්ය උපාධි පර්යේෂකයෙකු ලෙසත්, ජපානයේ ජපන් පරමාණුක බලශක්ති පර්යේෂණ ආයතනයේ පොදුරාජ්‍ය මණ්ඩලීය විද්‍යාත්මක තොරතුරු සහ පර්යේෂණ ආයතනයේ පශ්චාත් - ආචාර්ය උපාධි පර්යේෂකයෙකු ලෙසත්, එක්සත් රාජධානියේ, කාඩිෆ්,වේල්ස් කාඩිෆ් විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ පශ්චාත් - ආචාර්ය උපාධි පර්යේෂකයෙකු ලෙසත්, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, ගම්පහ වික්‍රමආරච්චි ආයුර්වේද ආයතනයේ අධ්‍යක්ෂ, කැලණිය විශ්වවිද්‍යාලයේ රසායන විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධානී ලෙස කටයුතු කර ඇත. ඇය රසායනික විශ්ලේෂණය සහ පාරිසරික විශේෂණය පිළිබඳව පර්යේෂණ උනන්දුවක් දක්වන අතර අකාබනික රසායන විද්‍යාව ඉගැන්වීම පිළිබඳව උනන්දුවක් දක්වයි.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච් ඩී කරුණාරත්න (2021 ජූනි 11 දින සිට)	විටිගේ දොන් කරුණාරත්න ශ්‍රී ලාංකික ව්‍යාපාරික ආර්ථික විද්‍යාඥයෙක්, ශාස්ත්‍රඥයෙක්, ලේඛකයෙක් සහ මානව සම්පත් ප්‍රවර්ධන ආයතනයේ අධ්‍යක්ෂවරයෙකි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පීඨාධිපතිවරයා විය. ඔහු ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර වීදී (ආර්ථික විද්‍යා විශේෂ) උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය(ආර්ථික විද්‍යාව), ජපානයේ නෙගෝයා සිටි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති (ආර්ථික ප්‍රතිපත්ති) උපාධිය, ජපානයේ නෙගෝයා සිටි විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය ලබා ඇත. H.D. කරුණාරත්න මහතා දැනට කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි (DBA) වැඩසටහනේ සම්බන්ධීකාරක ලෙස සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක සභාවේ සභාපති ලෙස කටයුතු කරයි. ඔහු 2014 ඔක්තෝම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ උප සභාපති සහ ටෝකියෝ විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා කාර්යාලයේ අධ්‍යක්ෂවරයා තිඹිරිගස්යායේ විරෝස් ලොක් ආයතනයේ පර්යේෂණ සහකාරවරයකු ලෙස ආරම්භ කළ ඔහු 2011 සිට 2014 දක්වා ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ පීඨාධිපති ලෙස පත් කරන ලදී. එම පත්වීමට පෙර H.D.කරුණාරත්න මහතා ජපානයේ ටෝකියෝ හි හොසෙයි විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා පීඨයේ ආරාධිත මහාචාර්යවරයා ලෙස 2006 අප්‍රේල් සිට 2008 මාර්තු දක්වා කටයුතු කළේය. එමෙන්ම ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨය විසින් ප්‍රකාශයට පත් කරන ලද "Colombo Business Journal" හි නිර්මාතෘ සහ ප්‍රධාන කර්තෘවරයා ලෙසද කටයුතු කළේය. ඔහු 2000 සිට 2015 දක්වා කාලය තුළ විවිධ වර්ෂවලදී කොළඹ විශ්වවිද්‍යාලයේ (FGS – UOC) උපාධි අධ්‍යයන පීඨයේ MBA, MBS, MDS සහ PGDBM වැඩසටහන් සඳහා වැඩබලන පීඨාධිපති, වැඩබලන අධ්‍යයන අධ්‍යක්ෂ සහ සම්බන්ධීකාරක ලෙස කටයුතු කළේය. ඔහු එම පීඨයේම සංවර්ධන අධ්‍යයන මණ්ඩලයේ (BSDS) සහ වෘත්තීය අධ්‍යයන සඳහා අධ්‍යයන මණ්ඩලයේ (BSPS) සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) වැඩ බලන අධ්‍යක්ෂවරයා ලෙසද (2015 ජනවාරි සිට මැයි දක්වා) සේවය කර ඇත. ඔහු ආයතනයේ මානව සම්පත් කළමනාකරණය සහ අධ්‍යයන සින්ඩිකේට් මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස

	විවිධ වසරවලදී සේවය කර ඇත. ඔහු 2011 සිට 2015 දක්වා ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය. ඔහු 2010 සිට 2014 දක්වා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ (NCAS) පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සේවය කළේය. H. D. කරුණාරත්න මහතා 2010 සිට 2014 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත් වූ බාහිර සාමාජිකයා විය.ඔහු රත්මලාන ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි. H. D. කරුණාරත්න ශ්‍රී ලංකා ජපන් උපාධිධාරීන්ගේ ආදි ශිෂ්‍ය සංගමයේ (JAGAAS) සභාපති වූයේ 2014 වසරේදීය.ඔහු 2010 සිට 2013 දක්වා එම සංගමයේ ලේකම්වරයා ලෙස කටයුතු කරන ලදී. ඔහු 2014 ඔක්තෝම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ උප සභාපතිවරයා වන අතර 2010 සිට 2013 දක්වා එම සංගමය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ආර්ථික සඟරාවේ කර්තෘවරයා විය.
මහාචාර්ය ආර් එම් කේ රත්නායක (2021 ජූනි 11 දින සිට)	මහාචාර්ය ආර් එම් කේ රත්නායක මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ඔහු භූගෝල විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) (1990), M.Phil (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) නාගරික සහ වෛද්‍ය භූගෝල විද්‍යාව (1996) M.Sc. (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) GIS සහ RS, (2012), නාගරික ස ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ Ph.D.(SJP/Uppsala) 2005) උපාධි ලබා ඇත උපාධියේ සිට බවූ වෘත්තීයමය තනතුරු - (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය) තාවකාලික සහකාර කථිකාචාර්ය, කථිකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I, සහකාර මහාචාර්ය, සභාපති (CDC/මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය), මාණ්ඩලික පුහුණු වැඩසටහන් කමිටුවේ සාමාජික, (SDC), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සභාපති, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සුබසාධක සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, භාණ්ඩාගාරික, භාණ්ඩාගාරික, භූගෝල විද්‍යා සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, උප සභාපති, විශ්වවිද්‍යාල විනය පාලක, වැඩබලන විනය පාලක, නියෝජ්‍ය විනය පාලක (කලා), උප සභාපති, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සුභසාධක සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සුනාමි ආපදා සහන අරමුදලේ කමිටු සාමාජික, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, පරිගණක උපදේශක කමිටුවේ පීඨ සාමාජික, භූගෝලීය තොරතුරු පද්ධති (GIS) පර්යේෂණ විද්‍යාගාරයේ සම්බන්ධීකාරක, භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුව, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමයේ කමිටු සාමාජික, සම්බන්ධීකාරක - GIS සහ RS පිළිබඳ ඩිප්ලෝමාව, සම්බන්ධීකාරක - GIS සහ RS පිළිබඳ ඩිප්ලෝමාව, සම්බන්ධීකාරක - M.Sc. GIS සහ RS, සමස්ත සම්බන්ධීකාරක, IDAS මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, නුගේගොඩ පර්යේෂණ ප්‍රදේශ -GIS සහ RS ප්‍රාදේශීය සංවර්ධන නාගරික සහ ජනාවාස අධ්‍යයන වෛද්‍ය භූගෝල විද්‍යාව.
මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ (2021 ජූනි 11 දින සිට)	මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිනිය වන අතර කැලණිය විශ්වවිද්‍යාලයේ ලලිත කලා අධ්‍යනාංශයේ මහාචාර්යවරියක් සහ ප්‍රධානියා වේ. තවද කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ ලේකම්, ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික, රංග කලා ශිෂ්‍ය සංගමය, ලලිත කලා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලයේ කලාගාරයේ සම්බන්ධීකාරක ලෙස කටයුතු කරයි. ඇයගේ අධ්‍යාපන සුදුසුකම් ලෙස 2012 දී PhD උපාධිය **“ඉන්දියානු මූලාකෘතියෙන් ස්වාධීන ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමාවේ සම්භවය සහ පරිණාමය”** වේ. ආගමික අධ්‍යයන අධ්‍යයනාංශය, බටහිර විශ්වවිද්‍යාලය, කැලිෆෝනියාව, ඇමරිකා එක්සත් ජනපදය සහ 2000 දී MSc උපාධිය "ශ්‍රී ලංකාවේ මහායාන බෝධිසත්ත්ව මූර්තිවල සංකේතාත්මක ලක්ෂණ: ක්‍රි.ව. 3 සිට 19 වැනි සියවස දක්වා." (නිබන්ධ මාධ්‍ය- සිංහල:) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව, 1995 දී පුරාවිද්‍යාව

	පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව, 1994 දී ස්මාරක සහ ස්ථාන වාස්තු විද්‍යාත්මක සංරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මොරටුව විශ්වවිද්‍යාලය, මොරටුව, ශ්‍රී ලංකාව සහ 1992 දී 2 වන පන්තියේ ඉහළ සමාර්ථයක් සහිත BA (ගෞරව) උපාධිය , කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව දැක්විය හැකිය. ඇය, ලලිත කලා අධ්‍යයනාංශයේ දෘශ්‍ය කලා සහ නිර්මාණ සහ රංග කලා ඒකකයේ ප්‍රධානී, අධ්‍යක්ෂ, පර්යේෂණ මධ්‍යස්ථානය, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය,සම්බන්ධීකාරක, ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය සහ සම්බන්ධීකාරක (සමස්ත), HETC/ IDAS, මානව ශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය වැනි පරිපාලනයේ දරන තනතුරු දරා ඇත. බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස 2018 බාහිර කථිකාචාර්ය, ඉංජිනේරු පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2017-2018 බාහිර කථිකාචාර්ය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, 2016-2018 බාහිර කථිකාචාර්ය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලෙස සේවය කර ඇත. ඇයගේ ඉගැන්වීම් ක්ෂේත්‍ර ලෙස ශ්‍රී ලංකාවේ ජන හා නාගරික රහහල, ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ජන සහ සම්භාව්‍ය නර්තන සම්ප්‍රදායන්, බෞද්ධ කලාව සහ ගෘහ නිර්මාණ ශිල්පය: ඉන්දියාව සහ ශ්‍රී ලංකාව, ඉන්දියාවේ සහ දකුණු ආසියාවේ බෞද්ධ නොවන කලා සම්ප්‍රදායන්, ශ්‍රී ලංකාවේ චිත්‍ර සහ ගෘහ නිර්මාණ ශිල්පය ආදිය දැක්විය හැකිය.
මහාචාර්ය කෝලිත භානු දිසානායක (2021 ජූනි 11 දින සිට)	මහාචාර්ය කෝලිත භානු දිසානායක මහතා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති, ජාතික චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ස්වාධීන රූපවාහිනී ජාලයේ ITN ටෙලිනාට්‍ය පෙරදසුන් කමිටුවේ මණ්ඩල සාමාජික ලෙස කටයුතු කරයි. ඉන්දියාවේ බනාරස් හින්දු විශ්වවිද්‍යාලයේ සංගීත ශාස්ත්‍රපති උපාධිය, B.F.A (ගෞරව), සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය (දැනට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය), සංගීත් විශාරද, සංගීත උපකරණ පිළිබඳ ඩිප්ලෝමාව, භාත්ඛණ්ඩේ සංගීත විද්‍යාපීත්, ඉන්දියාව ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් මහාචාර්ය කෝලිත භානු දිසානායකගේ පර්යේෂණ ක්ෂේත්‍ර වන්නේ උතුරු ඉන්දීය සම්භාව්‍ය සංගීතය, ඉන්දියානු චිත්‍රපට සංගීතය (හින්දි), සමකාලීන සංගීතය සහ ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීතයේ වර්තමාන ප්‍රවණතා ය.
මහාචාර්ය එස්.පී. කරුණානායක (2018 ජූනි 26 දින සිට)	ශිරෝනිකා පී. කරුණානායක මිය අධ්‍යාපන තාක්ෂණය පිළිබඳ මහාචාර්යවරියක වන අතර ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයේ (OUSL) අධ්‍යාපන පීඨයේ වත්මන් පීඨාධිපතිවරියයි. ඇය 2012 සිට 2015 දක්වා අධ්‍යාපන පීඨයේ පීඨාධිපතිය ලෙසත් 2006 සිට 2012 දක්වා ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙසත් කටයුතු කළාය. ඇය 1993 සිට ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කටයුතු කළාය. ඊට පෙර ඇය දශකයකට වැඩි කාලයක් ශ්‍රී ලංකා ද්විතීයික පාසල් පද්ධතිය තුළ පුහුණු විද්‍යා ගුරුවරියක් ලෙස අත්දැකීම් ලබා ඇත. අධ්‍යාපනය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT), ඉගෙනුම් හා ඉගැන්වීම් අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා උපදේශනාත්මක සැලසුම, විවෘත අධ්‍යාපනික සම්පත් (OER) සහ විවෘත අධ්‍යාපන පිළිවෙත් (OEP) ඇයගේ ප්‍රධාන පර්යේෂණ කේන්ද්‍රීය ක්ෂේත්‍ර
මහාචාර්ය ඕ.ජී දයාරත්න බණ්ඩා (2015 ඔක්තෝබර් 12 දින සිට)	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා පීඨයේ පීඨාධිපති වන මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩා මහතා 1995 වසරේ දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ පළමු වැනි පන්තියේ ශාස්ත්‍රවේදී ගෞරව උපාධියක් ද 2000 වසරේ දී දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ගෙන ඇත. ඔහු ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව හා මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂීකරණය වෙමින් සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලයෙන් සිය දර්ශනශූරී උපාධිය දිනා ගන්නා ලදී. 1995 වසරේ සිට ඔහු ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හා මහාචාර්යවරයෙක් ලෙස සේවය කර තිබේ. වර්තමානය වන විට ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ

	අධ්‍යයන අංශයේ මහාචාර්යවරයෙක් ලෙස කටයුතු කරයි. තව ද ඔහු 2006 සිට 2007 දක්වා කැනඩාවේ වෝටලූ විශ්වවිද්‍යාලයේ බාහිර පර්යේෂණ මහාචාර්යවරයෙක් ලෙස ද සේවය කර ඇත. මෙකී අධ්‍යාපනඥ තනතුරුවලට අමතරව ඔහු ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ පීඨාධිපති, කලා පීඨයේ පශ්චාත්-උපාධි වැඩසටහන්වල සභාපති හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාලේඛන විද්‍යාව පිළිබඳ අධ්‍යයන අංශයේ අංශාධිපති ඇතුළු විවිධ පරිපාලන ධුරයන් ද හොබවා ඇත. ඔහු අන්තර්ජාතික නිර්දේශක චාරසඟරාවල ලිපි රාශියක් පළ කර ඇති අතරම ශාස්ත්‍රීය කෘතීන් ලෙස ග්‍රන්ථ හා පොත් පරිච්ඡේද රාශියක් ද ප්‍රකාශයට පත් කර ඇත. ඔහුගේ පර්යේෂණ අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා සාර්වආර්ථික විද්‍යාව පිළිබඳ විවිධ අධ්‍යයනවල ගෝලීය වශයෙන් නිර්දේශ කර ඇත. ව්‍යවහාරික සාර්වආර්ථික විද්‍යාව, මූල්‍ය ආර්ථික විද්‍යාව, මුදල් ආර්ථික විද්‍යාව, ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ ගැටළු, අන්තර්ජාතික ආර්ථික සංකලනය හා වෙළඳ ගිවිසුම් ඔහුගේ පර්යේෂණ ක්ෂේත්‍රවලට ඇතුලත් වේ. තව ද ඔහු ප්‍රතිපත්ති සම්පාදන සාකච්ඡාවලට හා සමකාලීන ගැටළු පිළිබඳ විවාදවලට සක්‍රීයව දායක වන විද්වතෙක් ද වේ.
මහාචාර්ය ඩබ්ලිව්. අයි. නානායක්කාර (2015 ජුනි 19 දින සිට)	ඩබ්ලිව්. ඉන්දිරා නානායක්කාර මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී ගෞරව) උපාධිය සහ දර්ශනපති උපාධිය දිනා ගෙන ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වන ඇය ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ද වේ. වර්තමානය වන විට ඇය ප්‍රථම උපාධි හා පශ්චාත්-උපාධි මට්ටම්වලට සමාගම් නීතිය, අන්තර්ජාතික ආයෝජන නීතිය, ව්‍යාපාර නීතිය, වාණිජ බේරුම්කරණය හා බැංකු නීතිය උගන්වනු ලබයි. එමෙන්ම ඇය අන්තර්ජාතික ආයෝජන නීතිය හා ගෝලීයකරණය, ආයතනික නීතිය, පාරිභෝගික නීතිය, බැංකු නීතිය, තරහකාරීත්ව නීතිය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාතික හා අන්තර්ජාතික වශයෙන් ලිපි ඉදිරිපත් කර ඇත.
මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද (2019 ජූලි 02 දින සිට)	මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා වන අතර ශ්‍රී ලංකා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙකි. ඔහු 1999 වසරේ සිට එම පීඨයේ සේවය කර ඇත. ඔහු ටෝකියෝ හි ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ ජාතික උපාධි ආයතනයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ජපානයේ නගෝයා විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සංවර්ධන උපාධි පාසලෙන් ආචාර්ය උපාධිය ද ලබා ගත්තේය. ඔහු මධ්‍යම හා කුඩා පරිමාණ වැවිලි කර්මාන්ත සහ ග්‍රාමීය මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (2005-2006), වතු යටිතල පහසුකම් සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (2006 - 2007) සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය (2007-2008) ඇතුළු ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කරන ලද බොහෝ ව්‍යාපෘතිවල උපදේශකයන් හෝ කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ (NLDB) අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර ඇත.
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා (2018 පෙබරවාරි 20 දින සිට)	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්යවරයෙකි. ඔහුට, කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය දෙවන පන්තියේ ඉහළ), කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, එඩින්බරෝ විශ්වවිද්‍යාලයේ සමාජ මානව විද්‍යාව පිළිබඳ MSc උපාධිය සහ එඩින්බරෝ විශ්වවිද්‍යාලයේ සමාජ මානව විද්‍යාව පිලිබඳ Ph.D. උපාධියක් හිමිය. විසිඑක්වන සියවසේ උසස් අධ්‍යාපනය යටතේ 'වාර්ගික සහජීවනය' පිළිබඳ ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාල සම්බන්ධීකාරක, කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක, කොළඹ

	විශ්වවිද්‍යාලයේ කලා පීඨ ආචාර්යවරුන්ගේ සංගමයේ සභාපති, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ මධ්‍යස්ථානයේ උප සභාපති, ශ්‍රී ලංකා සමාජ විද්‍යා සංගමයේ සභාපති, කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ M. Phil උපාධි සම්බන්ධීකාරක, කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ MA සම්බන්ධීකාරක, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය සංගමයේ ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරික, FND පාඨමාලා සම්බන්ධීකාරක, කලා පීඨය, විශ්වවිද්‍යාල ක්‍රීඩා මණ්ඩලයේ ශාස්ත්‍ර පීඨයේ නියෝජිත, "සමාජ විද්‍යාවන් ජනප්‍රිය කිරීමේ" කමිටුවේ ගරු ලේකම්, ශ්‍රී ලංකා විද්‍යා ප්‍රගමනය සඳහා වූ සංගමය (SLAAS), කොළඹ විශ්වවිද්‍යාලයේ තෙලේවෙල ශිෂ්‍ය නේවාසිකාගාරයේ උප පාලක, කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය මාණ්ඩලික පීඨ මධ්‍යස්ථානයේ ගරු භාණ්ඩාගාරික, කොළඹ විශ්වවිද්‍යාලයේ කලා පීඨ ආචාර්ය සංගමයේ උප සභාපති සහ කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මාණ්ඩලික පීඨ මධ්‍යස්ථානයේ ක්‍රීඩා ලේකම් තනතුරු දැරීම ඔහුගේ පරිපාලන වගකීම්
මහාචාර්ය එම් එම් ගුණතිලක (2019 දෙසැම්බර් 19 දින සිට)	මහාචාර්ය එම්.එම්. ගුණතිලක කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයායි. ඔහු B.A., M.A., Ph.D. උපාධි ලබා ගෙන සහ කැලණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්යවරයෙක් ලෙස සේවය කරයි. ඔහු ඉගැන්වීමේ උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර වන්නේ අතරමැදි ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව, උසස් ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ ආර්ථික විද්‍යාව සඳහා ගණිතය සහ පර්යේෂණ උනන්දුව දක්වන ක්ෂේත්‍ර වන්නේ සංවර්ධන ආර්ථික විද්‍යාව, ග්‍රාමීය ආර්ථිකය සහ ආහාර සුරක්ෂිතතාවයයි. ඔහු ලබා ගත් ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව වන්නේ, පොදුරාජ්‍ය මණ්ඩලීය (බෙදීම-අඩවිය) ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය, ෆිට්ස්විලියම් විද්‍යාලය, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය, 2002- 2003, IAS (Prowse) අධිශිෂ්‍යත්වය, වැන් මිල්ඩර්ට් විද්‍යාලය, ඩර්හැම් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය 2010.

NCAS හි යහපාලනය

NCAS 2020 වසර තුළ දී සිදු කළ සියලුම ක්‍රියාකාරකම් හරහා යහපාලන ව්‍යවහාර ක්‍රියාත්මක කිරීමට සහ උසස් ප්‍රමිතීන් අදාළ කර ගැනීමට කැපවුනි. මෙමඟින් අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලවීම, ගනුදෙනුවල විනිවිදභාවය වැඩිදියුණු කිරීම, වගවීම සහ රජයේ අරමුදල් සඳහා වගකීම වැඩිදියුණු කරයි.

1) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සහ NCAS ආඥාපනතට අනුකූලවීම

<u>පාලක සභාවේ පත්වීම් සහ සංයුතිය</u>

පාලක සභාව NCAS හි තීරණ ගැනීමේ අධිකාරිය ලෙස පත් කර තිබෙන අතර එහි සංයුතිය පහත පරිදි

01) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යවරයා

ගරු. ආචාර්ය බන්දුල ගුණවර්ධන
ගරු. මහාචාර්ය ජී එල් පීරිස්

02) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපති

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග

03) NCAS කළමනාකරණ සභා සභාපති

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ

04) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විෂයන්ට අදාළ පීඨ හයේ පීඨාධිපතිවරු — අදාළ ස්ථාවර කමිටු මඟින් නම් කළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා

ආචාර්ය උපාලි පන්නිලගේ	පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය රුහුණ විශ්වවිද්‍යාලය
මහාචාර්ය (ආචාර්ය) කේ. සුදාකර්	පීඨාධිපති, කලා පීඨය යාපනය විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඩබ්ලිව්. අයි. නානායක්කාර	පීඨාධිපති, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩාර	පීඨාධිපති, කලා පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා	පීඨාධිපති,කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය එම් එම් ගුණතිලක	පීඨාධිපති,සමාජ විද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

05) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයින් සිව්දෙනා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච් ඩී කරුණාරත්න
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික) ලක්ෂ්මන් දිසානායක
මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ

සභාවේ ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

<u>කළමනාකරණ සභාවේ පත්වීම් සහ සංයුතිය</u>

කළමනාකරණ සභාව NCASහි කළමනාකරණ තීරණ ගැනීමේ අධිකාරිය ලෙස පත් කර තිබෙන අතර එහි සංයුතිය පහත පරිදි වේ

1) සභා සභාපති වන අධ්‍යක්ෂක

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ

2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා විෂයන්ට අදාළ පීඨ හයේ පීඨාධිපතිවරු — අදාළ ස්ථාවර කමිටු මඟින් නම් කළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා

මහාචාර්ය ශිරන්ත හීන්කෙන්ද	පීඨාධිපති, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
මහාචාර්ය එම් එම් ගුණතිලක	පීඨාධිපති, සමාජ විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය එස් පී කරුණානායක	පීඨාධිපති, අධ්‍යාපන පීඨය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඕ ජී දයාරත්න බණ්ඩා	පීඨාධිපති, කලා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මහාචාර්ය ඩබ්ලිව් අයි නානායක්කාර	පීඨාධිපති, නීති පීඨය කොළඹ විශ්වවිද්‍යාලය
මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා	පීඨාධිපති, කලා පීඨය කොළඹ විශ්වවිද්‍යාලය

03) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයින් සිව්දෙනා

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච් ඩී කරුණාරත්න
මහාචාර්ය ආර් එම් කේ රත්නායක
මහාචාර්ය ප්‍රශාන්ති නාරංගොඩ
මහාචාර්ය කෝලිත හානු දිසානායක

සභාවේ ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

2) රජයේ මූල්‍ය රෙගුලාසි සහ රාජ්‍ය කාර්යපටිපාටියට අනුකූලවීම

NCAS රජයේ සම්පූර්ණ අරමුදල්ලාභී ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන බැවින් සිදු කළ සියලුම මූල්‍ය ගනුදෙනු රජයේ මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ චක්‍රලේඛ ආදියට අනුකූලව වාර්තා කරනු ලැබේ.

3) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

වසර තුළ දී අත්කර ගත් සියලුම භාණ්ඩ හා සේවා ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව සිදු කර ඇත. NCAS කළමනාකරණ සභාව විසින් ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරන ලදී. එම කමිටුවල සේවය කළ සාමාජිකයින් පහත දැක්වෙන පරිදි වේ.

<u>අධ්‍යයන අංශ ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන)</u>

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි /අධ්‍යක්ෂ/NCAS

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිත ඒ ලියනගේ/වැඩබලන අධ්‍යක්ෂ/NCAS

ජී.ආර්.කේ.එස්.ගනේගොඩ මහතා/ ගණකාධිකාරී /MOHE

ටී.එලන්වෙලියපල්වාන් මිය / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /NCAS

<u>අධ්‍යයන අංශ ප්‍රසම්පාදන කමිටු (කනිෂ්ඨ)</u>

මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි/අධ්‍යක්ෂ/NCAS

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජනිත ඒ ලියනගේ/වැඩබලන අධ්‍යක්ෂ/NCAS

සුරංජී විජයකුලසූරිය මිය/නියෝජ්‍ය ගණකාධිකාරී/ UGC

ටී.එලන්වෙලියපල්වාන් මිය / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /NCAS

<u>තාක්ෂණික ඇගයීම් කමිටුව</u>

රසික කරුණාරත්න මහතා / නියෝජ්‍ය ලේකම් / UGC

ඩී.පී.සරත් චන්ද්‍ර මහතා / ඉංජිනේරු උපදේශක /UGC

ඒ.ඒ.එස්. චින්තනි මිය / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී/NCAS

එස්. චන්ද්‍රසේන මහතා / සහකාර ජාල කළමනාකරු

4) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය සහ බඳවා ගැනීමේ පටිපාටිය

වැටුප්, පත්වීම්, උසස්වීම්, වැටුප් වර්ධක හා නිවාඩු ඇතුළු සියලුම කාර්ය මණ්ඩල කටයුතු විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට හා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සිදු කර ඇත. මුදල් අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ද කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා සඳහා අදාළ කර ගෙන තිබේ.

5) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති (SLPSAS), ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) සහ අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRSs)

NCAS හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) හඳුන්වා දී නොමැති ගනුදෙනු වාර්තා කිරීම සඳහා ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) හා අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) අදාළ කර ගෙන ඇත

6) අපේක්ෂකයින් තෝරා ගැනීම සහ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා වූ NCAS මාර්ගෝපදේශ

ඉහත මාර්ගෝපදේශවලට අනුව දර්ශනශූරී උපාධි ශිෂ්‍යත්ව සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ කළමනාකරණ සභාව මඟින් තේරීම් කමිටු පත්කර ඇත.

අධ්‍යයන නිවාඩු සඳහා හිමිකම් කියන ස්ථිර අපේක්ෂකයින් NCAS හි පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබති. අපේක්ෂකයින්ට ශාස්ත්‍රපති උපාධියක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගන්නා විශ්වවිද්‍යාලයෙන් ලද වලංගු පත්වීමක් තිබිය යුතුය.

වසරක් සඳහා ප්‍රදානවල ප්‍රමාණය පහත දැක්වෙන පරිදි තීරණය කරනු ලැබේ:

- ද්ශීය විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වී ඇති ඉල්ලුම්කරුවන්ට, නිල ආයතනික ගාස්තුව හා පර්යේෂණ වියදම් මත පදනම්ව, වසරකට ලබා දෙන ප්‍රදාන ප්‍රමාණය තීරණය කරනු ලැබේ

- විදේශීය විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වී ඇති ඉල්ලුම්කරුවන්ට, නිල ආයතනික ගාස්තුව හා රටට අදාළව එහි ජීවන වියදම් මත පදනම්ව, එක් පුද්ගලයෙකුට වසරකට ලබා දෙන ප්‍රදාන ප්‍රමාණය තීරණය කරනු ලැබේ.මෙම කාණ්ඩය යටතේ වසරකට උපරිමය වන්නේ රුපියල් මිලියන 2.0 කි

NCAS හි කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ

- මහාචාර්ය ලාල් මර්වින් ධර්මසිරි
  අධ්‍යක්ෂ

- ාෂ්ඨ මහාචාර්ය ජනිතා ඒ ලියනගේ
  වැඩ බලන අධ්‍යක්ෂ

කළමනාකරණ කාර්ය මණ්ඩලය

- ටී. එලන්වෙලියපල්වන් මිය
  ාෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
  Bsc. Agriculture (Hons.) (EUSL), Master of Food Science and Technology (PDN)

- ඒ. ඒ. එස්. චින්තනි මිය
  ාෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
  BBMgt (Accountancy) (KLN), Master in Business in Accountancy (KLN)

- සම්පත් චන්ද්‍රසේන මහතා
  සහකාර ජාල කළමනාකරු (I ශ්‍රේණිය)
  BIT in Information Technology (UCSC), MSc. in Information Security (CMB), Diploma in Management (OUSL), Higher Diploma in Information Technology (CMB) බ්‍රිතාන්‍ය පරිගණක සමාජයේ සාමාජික (MBCS) සහ ශ්‍රී ලංකා පරිගණක සමාජයේ සාමාජික (MCSSL).


වෙනත් කාර්ය මණ්ඩලය

- ඒ. එල්. ඩී. පෙරේරා මහතා ~ පුස්තකාල තොරතුරු සහකාර (II ශ්‍රේණිය)
- එම් පී පී කේ ජයරත්න මෙනවිය ~ කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)
- ක්. එම්. ජී. ජී. ධනුෂ්ක මහතා ~ කළමනාකරණ සහකාර (පොත් තබන්නා) (III ශ්‍රේණිය)
- ආර්. කේ. පී. අයි. රත්නායක මහතා ~ කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)
- විනෝදිත ටිටිආරච්චි මහතා ~ කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)
- ආර්.ජී .එම් සංජීව මහතා ~ රියදුරු (II ශ්‍රේණිය)
- පී.පී.කේ. බාලසූරිය මහතා ~ වැඩ සහායක (III ශ්‍රේණිය)
- එච්.එස්.බී.කරුණාරත්න මහතා ~ වැඩ සහායක (III ශ්‍රේණිය)

වගුව 02: NCAS හි සේවක තනතුරු

අංකය	තනතුර		ශ්‍රේණිය		අනුමත සේවක සංඛ්‍යාව	වැටුප් කේතය	2020.12.31 දිනට සිටිනා කාර්ය මණ්ඩල සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම							
1	අධ්‍යක්ෂ				1	U - AC 5(II)	1
2	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති		II		1	U - AC 3(II)	-
3	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී				1	U- EX 2(II)	1
4	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී				1	U- EX 2(II)	1
තෘතීය මට්ටම							
5	සහකාර ජාල කළමනාකරු		I		1	U- AS 2(II)	1
ද්විතීය මට්ටම							
6	කළමනාකරණ සහකාර		III		4	U-MN 1(III)	3
7	කළමනාකරණ සහකාර (පොත් තබන්නා)		III		1	U-MN 1(III)	1
8	පුස්තකාල තොරතුරු සහකාර		III		1	U-MN 1(III)	1
ප්‍රාථමික මට්ටම							
9	රියදුරු		II		1	U-PL 3(III)	1
10	වැඩ සහායක		III		2	U-PL 1(III)	2

තොරතුරු ප්‍රස්ථාරය 01: NCAS හි සංවිධාන ව්‍යුහය



<u>වැඩමුළු/පාඨමාලා/ ඉදිරිපත් කිරීම්</u>

NCAS විසින් 2020 වර්ෂය තුළ දී වත්මන් ගැටළු පිළිබඳ පහත දැක්වෙන ඉදිරිපත් කිරීම්, පාඨමාලා සහ වැඩමුළු පවත්වන ලදී.

පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත පරිදි ය:

වගුව 3 : 2020 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළු/ පාඨාමාලා/ ඉදිරිපත් කිරීම් පිළිබඳ සාරාංශය

අංකය	සම්මන්ත්‍රණය	පවත්වන ලද දිනය	ඉලක්කගත කණ්ඩායම	සහභාගීත්වය	සටහන
1.	"සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS වෙත හැඳින්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව" ආචාර්ය නිශාරා ප්‍රනාන්දු හා එස්. චන්ද්‍රසේන	2020 ජනවාරි 18,19,25 සහ පෙබරවාරි 01 NCAS පරිගණක විද්‍යාගාරයේදී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	13	අවසන් කර ඇත
2.		2020 අගෝස්තු 09,16,23,30 NCAS පරිගණක විද්‍යාගාරයේදී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	10	අවසන් කර ඇත
අංකය	**සම්මන්ත්‍රණය**	**පවත්වන ලද දිනය**	**ඉලක්කගත කණ්ඩායම**	**සහභාගීත්වය**	**සටහන**
3.	"AMOS පිළිබඳ වැඩමුළුව" ආචාර්ය නිලක්ෂි ගලහිටියාවේ	2020 පෙබරවාරි 10,11 NCAS පරිගණක විද්‍යාගාරයේදී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	17	අවසන් කර ඇත
4.		2020 අගෝස්තු 13,18 NCAS පරිගණක විද්‍යාගාරයේදී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	12	අවසන් කර ඇත
අංකය	**සම්මන්ත්‍රණය**	**පවත්වන ලද දිනය**	**ඉලක්කගත කණ්ඩායම**	**සහභාගීත්වය**	**සටහන**
5.	ස්මාර්ට් PLS පිළිබඳ වැඩමුළුව ආචාර්ය ජේම්ස් රොබින්සන්	2020 සැප්තැම්බර් 22,23 NCAS පරිගණක විද්‍යාගාරයේදී	විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විධායක නිලධාරීන්	14	අවසන් කර ඇත
අංකය	වාර්ෂික පර්යේෂණ පරිසංවාදය	පවත්වන ලද දිනය	ඉලක්කගත කණ්ඩායම	සහභාගීත්වය	සටහන
07	වාර්ෂික පර්යේෂණ පරිසංවාදය 2020	2021 ජනවාරි 22-23 NCAS පරිගණක විද්‍යාගාරයේදී	අධ්‍යයන කාර්ය මණ්ඩලය	මාර්ගගතව සහභාගිවන්නන්	අවසන් කර ඇත

සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS භාවිත්වාදීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය සංඛ්‍යානමය විශ්ලේෂණය සඳහා SPSS භාවිත්වාදීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව NCAS හි පරිගණක විද්‍යාගාරයේ ද 2013 ජනවාරි 19වැනි දින සිට සති අන්තයේ දිනවල ආරම්භ කරන ලදී. එක් එක් පාඨමාලාව සඳහා 15දෙනෙක් බඳවා ගෙන ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිශාරා ප්‍රනාන්දු පුහුණුකරු ලෙස කටයුතු කළ අතර NCAS හි සහකාර ජාල කළමනාකරු ලෙස කටයුතු කරන සම්පත් චන්ද්‍රසේන මහතා විසින් පාඨමාලා සම්බන්ධීකරණය කරන ලදි. NCAS විසින් මෙම පාඨමාලාව 2019 වර්ෂයේ දී 7 වතාවක් පවත්වන ලද අතර විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය හා පර්යේෂකයින් 88 දෙනෙක් මෙයට සහභාගී විය. 2020 වසරේ NCAS විසින් පාඨමාලා දෙකක් පවත්වා ඇති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පර්යේෂකයින් 23 දෙනෙකු ඊට සහභාගී විය.

ප්‍රමාණාත්මක පර්යේෂණ සඳහා ව්‍යුහාත්මක සමීක්ෂණ ආදර්ශනය (AMOS සමඟ) පිළිබඳ වැඩමුළුව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් 2013 වර්ෂයේ ජනවාරි මස සිට ව්‍යුහාත්මක සමීක්ෂණ ආදර්ශනය (AMOS සමඟ) පිළිබඳ වැඩමුළුව ආරම් කරන ලදි. එක් එක් පාඨමාලාව සඳහා සහභාගීවන්නන් 12 දෙනෙක් පමණ ලියාපදිංචි වී ඇත. මෙම පාඨමාලාවේ පුහුණුකරුවන් ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ ජ්‍යෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය නිලක්ෂි ගලහිටියාවේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ මහාචාර්ය ජේ.ඒ.එස්.කේ. ජයකොඩි සහභාගී විය. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙ හි සහකාර ජාල කළමනාකරු සම්පත් චන්ද්‍රසේන විසින් පාඨමාලා සම්බන්ධීකරණය කරන ලදි. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් මෙම පාඨමාලාව 2018 වර්ෂයේ දී 3 වතාවක් පවත්වන ලද අතර විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන කාර්ය මණ්ඩලය හා පර්යේෂකයින් 38 දෙනෙක් මෙයට සහභාගී විය. 2019 වර්ෂය තුළ NCAS හට මෙම පාඨමාලාව පැවැත්වීමට නොහැකි විය. 2020 වර්ෂයේදී NCAS විසින් පාඨමාලා දෙකක් පවත්වා ඇති අතර අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ පර්යේෂකයින් 29 දෙනෙකු සහභාගී විය.

ව්‍යාපාර හා පරිපාලන රචනය පිළිබඳ වැඩමුළුව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් 2016 අගෝස්තු 03 සහ 04 වැනි දින සිට ව්‍යාපාර හා පරිපාලන රචනය පිළිබඳ වැඩමුළුව ආරම්භ කරන ලදි. උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය 2018 ඔක්තෝබර් 29-30 දිනවලදී විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා ව්‍යාපාර හා පරිපාලන රචනය පිළිබඳ වැඩමුළුවක් NCAS පරිශ්‍රයේ දී සංවිධානය කරන ලදි. මෙම වැඩමුළුවේ අරමුණ වන්නේ ඉංග්‍රීසි භාෂාව යොදා ගෙන විශ්වවිද්‍යාල පද්ධතියේ පරිපාලන කාර්ය මණ්ඩලයේ ලිවීමේ කුසලතාවය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ රාජකාරී ඉටු කිරීමේ දී ලිවීමේ කුසලතාවය පිළිබඳ නිපුණතා වැඩිදියුණු කිරීමයි. NIBM ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක එස්.විජේසිරි මහතා පුහුණුකරු ලෙස කටයුතු කළේය. ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියේ අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ 25 දෙනෙකු ඉහත පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූහ. 2019 වර්ෂය තුළ NCAS හට මෙම පාඨමාලාව පැවැත්වීමට නොහැකි විය.

මයික්‍රොසොෆ්ට් ඇඩ්වාන්ස්ඩ් එක්සෙල් පිළිබඳ වැඩමුළුව

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය 2014 අගෝස්තු 04 වැනි දින MS Excel 2010 උසස් සහතිකපත්‍ර පාඨමාලාව ආරම්භ කර අද දක්වාම සාර්ථකව අඛණ්ඩව පවත්වා ගෙන යයි. NCAS විසින් MS Excel 2010 වෙනුවට දිනපතා වැඩ කටයුතු බොහෝ කාලයක් ඉතිරි කර ගනිමින් පහසුවෙන් කිරීම සඳහා නවීන සූත්‍ර සහ තවත් කාර්යයන් ඇති MS Excel 2013 යොදා ගන්නා ලදී. මෙම වසර තුළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් 2018 ජූනි 13-14, අගෝස්තු 27-28 සහ ඔක්තෝබර් මස 04-05 යන දිනවල වැඩමුළු පවත්වන අතර විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 51ක් එයට සහභාගී වී ඇත. ඵලදායීත්වය වර්ධනය කිරීම සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම මෙම පාඨමාලාවේ ප්‍රධාන පරමාර්ථ වේ. 2019 වර්ෂය තුළ NCAS හට මෙම පාඨමාලාව පැවැත්වීමට නොහැකි විය.

තොරතුරු ආරක්ෂණය පිළිබඳ වැඩමුළුව

2019 වසරේ දී මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය විසින් තොරතුරු ආරක්ෂණය පිළිබඳ වැඩමුළුවක් විශ්වවිද්‍යාල සහ අනෙකුත් පද්ධතිවල විධායක කාර්ය මණ්ඩලය සඳහා

අලුතින් ආරම්භ කරන ලදි. වැඩමුළුවේ සම්පත් දායකයා වූයේ NCAS හි සහකාර ජාල කළමනාකරු සම්පත් චන්ද්‍රසේන මහතා ය. 2019 ඔක්තෝම්බර් 22 වන දින පැවති පළමු වැඩමුළුව සඳහා විධායක නිලධාරීන් 12 දෙනෙකු සහභාගී විය.

වාර්ෂික පර්යේෂණ පරිසංවාදය -2019 (2020 ජනවාරි 22 - 23)

මෙය 2021 ජනවාරි 22-23 දිනවල Zoom තාක්ෂනය හරහා NCAS රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පිළිබඳ 3 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයයි. සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිතයා ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සම්පත් අමරතුංග මහතා සහභාගි වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ හිටපු පීඨාධිපති සම්මානිත මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා විසින් සමාරම්භක සැසියේ ප්‍රධාන දේශනය පවත්වන ලදී.

පර්යේෂණ පත්‍රිකා කැඳවමින් පළකළ දැන්වීමට ප්‍රතිචාර වශයෙන් NCAS වෙත පර්යේෂණ පත්‍රිකා 302 ක් ලැබුණි. එම පර්යේෂණ සාරාංශ අතරින් පර්යේෂණ සාරාංශ 180 ක් මෙම සම්මන්ත්‍රණයට තෝරා ගන්නා ලදි. කෙසේ වෙතත්, මෙම පරිසංවාදය සඳහා සම-කතුවරුන් ඇතුළුව කතුවරුන් 170 දෙනෙක් ලියාපදිංචි වුහ. තෝරා ගත් සංඛ්‍යාවෙන්, පර්යේෂණ පත්‍රිකා 99ක් අදාළ කතුවරුන් විසින් සමාන්තර කාණ්ඩ 03ක් තුළ පහත දැක්වෙන තේමාවන් යටතේ ඉදිරිපත් කරන ලදි.

සැසියේ තේමාවන්
• ගිණුම්කරණය, මූල්‍ය, ව්‍යවසායකත්වය, කළමනාකරණය සහ පරිපාලනය
• මානව විද්‍යාව, සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව ස මනෝවිද්‍යාව
• කලාව, සංස්කෘතිය, භාෂාව, සාහිත්‍යය සහ ආගම
• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, මැතිවරණ ක්‍රමය, පාලනය සහ මාධ්‍ය
• භූගෝල විද්‍යාව, GIS, දත්ත විද්‍යාව සහ ICT
• මානව සම්පත් සංවර්ධනය, අධ්‍යාපනය, නිපුණතා සංවර්ධනය සහ ශ්‍රම වෙළඳපොළ
• දැනුම් ආර්ථිකය, වෙළඳාම, ආයෝජන, තාක්ෂණය සහ සංචාරක
• ාතික ආරක්ෂාව, නීතිය සහ සාමය, ජාත්‍යන්තර සබඳතා, සමාජ සංහිඳියාව සහ සාමය
• ස්වභාවික පරිසරය, ආපදා කළමනාකරණය ස තිරසාර සංවර්ධනය
• නගහනය, ස්ත්‍රී පුරුෂ භාවය, සංක්‍රමණය, සෞඛ්‍යය සහ යහපැවැත්ම

NCAS ජාත්‍යන්තර පර්යේෂණ පරිසංවාදයේ ඡායාරූප කිහිපයක්



NCAS හි තොරතුරු තාක්ෂණ සම්පත්

NCAS හි පරිගණක 20ක් සහ බහුමාධ්‍ය පහසුකම්වලින් සැදුම්ලත් පරිගණක විද්‍යාගාරයක් ඇත. විශ්වවිද්‍යාල අධ්‍යාපනඥයින්, විධායක නිලධාරීන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පරිගණක යෙදුම්, SPSS භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය, ව්‍යුහාත්මක සමීකරණ ආකෘති සඳහා AMOS, ප්‍රමාණාත්මක පර්යේෂණ සඳහා වූ EViews, ප්‍රමාණාත්මක පර්යේෂණ තොරතුරු ආරක්ෂාව සඳහා වූ NVIVO ආදිය පිළිබඳව පුහුණු කිරීම සඳහා මෙම විද්‍යාගාරය භාවිතා කරනු ලැබේ. ප්‍රදාන කළමනාකරණ තොරතුරු අධීක්ෂණය හා සැපයීම වෙනුවෙන් ප්‍රදාන කළමනාකරණ දත්ත සමුදා මෘදුකාංගය භාවිතා කරනු ලැබේ.

2019 වර්ෂයේ දී තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ:

- ආයතනය සඳහා වූ තාක්ෂණික පිරිවිතර, ව්‍යාපෘති යෝජනා සහ තාක්ෂණික වාර්තා ගොඩනැගීම
- වින්ඩෝස් සේවාදායක සහ LINUX සේවාදායක සහ රවුටර් වැනි ආශ්‍රිත උපකරණ සවි කිරීම, මහෙයවීම, සම්මුහුර්තකරණය, කළමනාකරණය හා නඩත්තු කිරීම.
- ස්වාදායක හා වැඩස්ථාන සඳහා මෘදුකාංග සවිකිරීම හා අනුකලනය කිරීම.
- ස්වාදායක කළමනාකරණය - ගොනු හා මුද්‍රණ සේවාදායක, සේවාදායක අතාත්විකකරණය, මූලික මහෙයුම් පද්ධති ප්‍රමිති, මෙහෙයුම් පද්ධති උසස් කිරීම් හා නඩත්තු කිරීම, උපස්ථ/ ප්‍රතිස්ථාපිත හා ස්වාදායක දෘඩාංග සම්මුහුර්තකරණය වැනි සේවාදායක නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- අධීක්ෂණය - අධීක්ෂණ හා විශ්ලේෂණ මෙවලම් පිළිබඳ නිර්දේශ සකස් කිරීම. අධීක්ෂණ මෙවලම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම. උපස්ථ හා ජාල ප්‍රශ්න විසඳීම ක්‍රියාත්මක කිරීම
- තාරතුරු ආරක්ෂක අවශ්‍යතාවන් ක්‍රියාත්මක කිරීම, අනුග්‍ර දැක්වීම, හා නඩත්තු කිරීම; ආරක්ෂක අණ්ඩ, මෙහෙයුම් පද්ධති උසස් කිරීම් හා දෘඩාංග උසස් කිරීම් ඇතුළු කාර්යසාධන පද්ධති.
- මධ්‍යම ප්‍රතිවෛරස කළමනාකරණ යෙදවුම නඩත්තු කිරීම.කැස්පර්ස්කි ප්‍රතිවෛසර මෘදුකාංග
- උසස් කිරීම්, අණ්ඩ දැමීම්, නව යෙදුම් හා උපකරණ නිර්දේශ කිරීම.
- වින්ඩෝස් සහ ලිනක්ස් වේදිකාව මත පදනම් වූ යටිතල පහසුකම් විසඳුමක් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපාර අවශ්‍යතාවන් විශ්ලේෂණය කිරීම. අනාගත පද්ධති වැඩිදියුණු කිරීම් ඇගයීම.
- ආයතනය සඳහා ඩෙබ් අඩවිය (www.ncas.lk) හා අන්තර්ජාලය හා පුස්තකාල දත්තසමුදාය නිරන්තරයෙන්ම ගොඩනැගීම
- www.ncas.ac.lk ඩොමේන් ස වෙබ් අඩවි පාදක පද්ධතිය ගූගල් සේවාව සමඟ ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම.
- සියලු අධ්‍යයන ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත විශ්ලේෂණ පාඨමාලා සහ SPSS, AMOS, NVIVO, EVIEWS වැනි වැඩමුළු සම්බන්ධීකරණය කිරීම

ශිෂ්‍යත්ව වැඩසටහන


භාණ්ඩාගාරය නව ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව සහ 2005-2020 දක්වා ශිෂ්‍යත්ව හිමි වූ NCAS ශිෂ්‍යත්වලාභීන්ගේ 1වැනි, 2වැනි හා 3වැනි වසරවල අධ්‍යයන කටයුතු සඳහා රු. මිලියන 42.99ක ප්‍රදානයක් වෙන් කරන ලදී. සමාලෝචිත වර්ෂය තුළ, NCAS විසින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සඳහා ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මූල්‍ය ප්‍රදානයන් ප්‍රදානය කරන ලද අතර සම්මුඛ පරීක්ෂණයට භාජනය වූ ප්‍රදානලාභීන් සඳහා 2020 අයවැය මගින් ප්‍රදාන 06ක් වෙන් කරන ලද නමුත් වසර තුළ ප්‍රදානය නිකුත් නොකළේය.

2020 වසර අවසානය වන විට විවිධ විශ්වවිද්‍යාල/ ආයතන සඳහා තෝරා ගනු ලැබූ අධ්‍යාපනඥයින් 501 දෙනෙක් සඳහා NCAS මඟින් අනුපූරක අරමුදලක් ලෙස ප්‍රදාන ලබා දෙන ලදී. මොවුන් අතුරින් ශිෂ්‍යත්වලාභීන් 307 දෙනෙක් සිය පශ්චාත්- උපාධි අධ්‍යයන කටයුතු අවසාන කර ඇත. කළමනාකරණය, භාෂා අධ්‍යයන, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව, ජන සන්නිවේදනය, ලලිත කලා, දේශීය වෛද්‍ය ආදී විෂයන් රාශියක් සම්බන්ධයෙන් ප්‍රදාන පිරිනමා ඇත.

වගුව 04: විෂයන් අනුව ප්‍රදානලාභීන්ගේ ප්‍රභේදනය 2005/2020

		2005	2006	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	එකතුව 2005/2020
1	මානව ශාස්ත්‍ර/ලලිත කලා	6	17	10	15	11	11	9	12	10	5	5	2	2	1	2	118
2	සමාජ විද්‍යා/ඉතිහාසය/ පුරා විද්‍යාව/ පුස්තකාල විද්‍යාව	27	16	12	14	15	6	5	7	7	12	2	2	2	1	3	131
3	අධ්‍යාපනය	3	-	2	1	3	-	1	-	2		2	-	-	1		15
4	නීතිය	1	1	-	1		1	-	-	1	6		-	2	1		14
5	කළමනාකරණය	9	5	3	10	8	12	8	17	14	14	12	3	3	4	1	122
6	වෙනත්	4	5	1	1	2	9	6	6	10	5	2	3	-	-		54
එකතුව		**50**	**44**	**28**	**42**	**39**	**39**	**29**	**42**	**44**	**41**	**23**	**10**	**9**	**8**	**6**	**454**


තොරතුරු ප්‍රස්තාරය **02:** විෂයන් අනුව ප්‍රදානලාභීන්ගේ ප්‍රභේදනය **2005/2020**



වගුව 05: ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව සඳහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා කිරීම

ප්‍රදානය කරන ලද අරමුදල් **(2008-2020)**		
වර්ෂය	ප්‍රදානය කළ මුදල රු.	අතිරේකව ප්‍රදානය කළ මුදල රු.
2008	23,589,220.00	
2009	39,665,659.00	
2010	39,364,958.79	
2011	60,000,000.00	8,720,000.00
2012	45,500,000.00	16,780,000.00
2013	83,035,817.00	
2014	95,396,122.00	
2015	83,598,118.69	
2016	68,644,031.50	
2017	106,673,603.39	
2018	69,387,333.80	
2019	51,625,620.73	
2020	42,993,988.12	

තොරතුරු ප්‍රස්තාරය 03: ප්‍රදානය කරන ලද අරමුදල් (2008-2020)




වගුව 06: ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සේවය කරන NCAS ආචාර්ය උපාධි ශිෂ්‍යත්වලාභීන්ගේ ව්‍යාප්තිය

(NCAS විසින් ලබා දෙනු ලැබූ ප්‍රදාන 2005-2020)

අංකය	රැකියාව කරන විශ්වවිද්‍යාලය	2005	2006	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	එකතුව
1	ශ්‍රී ලංකා නැඟෙනහිර විශ්වවිද්‍යාලය	1	1	1	3		3	3	2	2	1	1					19
2	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	2	2		3	5		1		6		2		1	2		23
3	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	5	1	2	2	4	3		4	3	4	2					31
4	ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය	1					1		4							1	8
5	කොළඹ විශ්වවිද්‍යාලය	11	9	6	4	3	2	1	3	7	13	5	1		2	1	67
6	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	10	11	7	4	2	1	2	2	3	4	1	1	4		1	56
7	යාපනය විශ්වවිද්‍යාලය	2	2			2	2	2	1	1							12
8	කැළණිය විශ්වවිද්‍යාලය	6	7	7	7	6	9	3	6	5	10	4	3		2	1	78
9	රුහුණු විශ්වවිද්‍යාලය	3	1	2	11	5	3	1			2	1		1	1	1	32
10	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	8	5	1	5	8	6	5	14	6	2	2	1	2	1		68
11	ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය		2		1	1	1	2		3		1	2				13
12	මොරටුව විශ්වවිද්‍යාලය						2					4				1	6
13	දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්වවිද්‍යාලය			2	2			2	1	2							9
14	ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය					1	1			1							3
15	ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය							1	1	1	1		1				7
16	ශ්‍රී පාලි මණ්ඩපය							1	1								2
17	වවුනියා මණ්ඩපය	1	1				1							1			5
18	ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය		2														3
19	දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය (IIM)					1	3	3	1	2	2						8
20	ත්‍රිකුණාමලය මණ්ඩපය								1				1				2
21	බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය									1							1
22	ඉංග්‍රීසි පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය																1
23	මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය										1						2
24	කලා අධ්‍යයන පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනය					1		1	1	1							4
25	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව						1	1			1						2
එකතුව		50	44	28	42	39	39	29	42	44	41	23	10	9	8	6	456

තොරතුරු ප්‍රස්තාරය 04: ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල සේවය කරන **NCAS** ආචාර්ය උපාධි ශිෂ්‍යත්වලාභීන්ගේ ව්‍යාප්තිය (**NCAS** විසින් ලබා දෙනු ලැබූ ප්‍රදාන (2005-2020)



වගුව 07: සම්පූර්ණ කරන ලද ප්‍රදාන

2020 වර්ෂය තුළ පරිපූරක අරමුදල් ලෙස NCAS හි මූල්‍ය ආධාර ඇතිව පහත සඳහන් විද්වතුන් 40 දෙනා ඔවුන්ගේ උසස් උපාධි සාර්ථකව ලබාගෙන ඇත.

අංකය	වර්ෂය	ප්‍රදානලාභියාගේ නම	රාජකාරී ස්ථානය	ලියාපදිංචි විශ්වවිද්‍යාලය	රට	අපේක්ෂිත උපාධිය
1	2014	ආචාර්ය කේ ඒ ජේ පී කේ මැදවත්ත	සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	කැලණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාව	ආචාර්ය උපාධිය
2	2016	ආචාර්ය එම් බී මුෆිතා	අන්තර් විෂය අධ්‍යයන අධ්‍යයනාංශය මොරටුව විශ්වවිද්‍යාලය	මලයා විශ්වවිද්‍යාලය	මැලේසියාව	
3	2016	ආචාර්ය පී කේ සී එම් විජේවික්‍රම	පුස්තකාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	බර්ලිනයේ ම්බෝල්ට් විශ්වවිද්‍යාලය	ජර්මනිය	ආචාර්ය උපාධිය
4	2015	ආචාර්ය කේ ජී එම් නානායක්කාර	වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය	ෆෙඩරේෂන් විශ්වවිද්‍යාලය	ඕස්ට්‍රේලියාව	ආචාර්ය උපාධිය
5	2005	ආචාර්ය උදා ටිටිගේ	පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය	කැලණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාව	ආචාර්ය උපාධිය
6	2014	ආචාර්ය එච් එම් ටී එස් හේරත්	වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය	කැලණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාව	ආචාර්ය උපාධිය දක්වා වන දර්ශනශූරී උපාධිය
7	2015	ආචාර්ය එච් ඒ එම් ඒ හපුගොඩ	භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	කොළඹ විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාව	ආචාර්ය උපාධිය
